# කෝට්ටේ යුගයේ සන්දේශවලින් හෙළි වන බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්

**ජී. ඩී. ඉන්දුකා මදුමාලි**

Information on Buddhist education reveals that the teaching of lord Buddha to his followers to adapt is considered a Buddhist educational concept. When Buddhism travelled across various countries, Buddhist education also expanded across countries making traditions of Buddhist education unique to countries. This theory is proven by observing the Sri Lankan Buddhist tradition. The purpose of this study is to discuss revealing factors of the Sri Lankan Buddhist education tradition in Sinhalese Literature. The subject of the study will be 'Sandesha' poetic literature of 'kotte' era known as the golden age of 'Sandesha'. Poetic Literature is also important in terms of Buddhist education. I intend to explore 'Sandesha' poetic Literature to reveal factors of the Sri Lankan Buddhist education tradition. For primary sources 'Sandesha' Literature such as 'Salalihini Sandeshaya' 'Hansa Sandeshaya' written in the Kotte era are used and as secondary sources, views of critics will be studied.

---

**© ජී. ඩී. ඉන්දුකා මදුමාලි**

සංස්. පී. ඒ. අමිල මදුසංක, ජයමල් ද සිල්වා, දිල්ෂාන් මනෝජ් රාජපක්ෂ,
චන්දන රුවන් කුමාර, එච්. ඒ. ගිහාන් මධුසංඛ, නන්දුලා පෙරේරා

**'ප්‍රභා' ශාස්ත්‍රීය සංග්‍රහය, සිවු වැනි කලාපය - 2014/2015**

මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

පෙරදිග ලෝකයේ පැරණි ම අධ්‍යාපන සම්ප්‍රදාය වේද අධ්‍යාපනයයි. වේද යන්නෙහි අර්ථය උතුම් දැනුම යයි ද, එය වනාහි පූජනීය ආගමික දැනුම වන්නේ යයි ද ආචාර්ය වින්ටර් නිට්ස් පවසයි.[1] අතීත භාරතීයයන්ගේ මූලික ඥානය රැස් කර තිබූ ග්‍රන්ථ සංහිතා ලෙස හැඳින්විණි. ඒවා වේද යන නාමයෙන් ප්‍රකට වී ඇත්තේ ඔවුන්ගේ ඥානය එහි ඇතුළත් වූ නිසා ය.[2] බුද්ධ කාලීන බ්‍රාහ්මණ අධ්‍යාපනයේ දී මේ වේදාංග ඉගැන්විණි. අධ්‍යාපනයේ ආරම්භය සිදු වූයේ ද බ්‍රාහ්මණයන්ගෙන් ම බව අග්ගඤ්ඤ සූත්‍රය විස්තර කරයි.[3] ඉක්බිති බෞද්ධ අධ්‍යාපනය පිළිබඳ තතු අපට අසන්නට ලැබේ. බුදුදහමෙහි ඉගැන්වෙන මූලික පරමාර්ථය සපුරා ගැන්මෙහි ලා ශ්‍රාවකයා විසින් අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ගය බෞද්ධ අධ්‍යාපනය වශයෙන් හැඳින්විය හැකි ය. එයට අදාළ පූර්ණ අධ්‍යාපන ක්‍රියාවලිය පිළිබඳ විවරණය බෞද්ධ අධ්‍යාපන සංකල්පය ලෙස සැලකිල්ලට භාජන වේ. බුදුදහම පරමාර්ථ සාධනීය ලෙස ජන සමාජය තුළ ප්‍රායෝගික ව උපයෝගිත්වයට භාජන වන ආකාරය බෞද්ධ අධ්‍යාපන සංකල්පයෙන් විවරණය වේ.[4]

බුදුරදුන් වදාළ අධ්‍යාපන ප්‍රතිපදාව පිළිබඳ වගකීම ශ්‍රාවක භික්ෂු සමාජය වෙත පැවරුණි. මුලින් භාරතය කේන්ද්‍ර කොටගෙන ව්‍යාප්ත වුණු බෞද්ධ අධ්‍යාපන ක්‍රමවේදය පසු ව ලංකාවට හා වෙනත් රටවලට ද ව්‍යාප්ත විය. ලංකාවේ බෞද්ධ අධ්‍යාපනය පිරිවෙන් මූලික කොටගෙන රට පුරා පැතිරී පැවතුණි. මිහිඳු මාහිමියන් විසින් අරිට්ඨ ඇතුළු භික්ෂු පිරිසට විනය ඉගැන්වීම ලංකාවේ බෞද්ධ අධ්‍යාපනයෙහි ආරම්භක අවස්ථාවයි.[5] එයින් පසු ව අරිට්ඨ මහ රහතන් වහන්සේගේ අතවැසි ශිෂ්‍යයන් වූ තිස්සදත්ත, කාලසුමන, දීඝසුමන ආදී තෙරවරුන්ගේ ශිෂ්‍ය පරම්පරාවන් විසින් මෙහි දී ම විනය ඉගෙන පරපුරෙන් පරපුරට අඛණ්ඩ ව පවත්වාගෙන පැමිණි බව විස්තර වේ.[6] ඉක්බිති යථෝක්ත භික්ෂූන් වහන්සේලා සහ නාග, බුද්ධරක්ඛිත, තිස්සදේව, සුමන, චූලනාග යන තෙරවරුන් ද රුහුණේ උපත ලද ධම්මපාලිත තෙරුන් සහ උන්වහන්සේගේ ශිෂ්‍ය ත්‍රිපිටකධර ඛේම තෙරුන් ද හෙළදිව දී ධර්ම විනය ඉගෙන, ධර්ම විනය හා බුදුදහමත්, බෞද්ධ අධ්‍යාපනයත් ලක්බිමෙහි ස්ථාපිත කිරීමට කැප වී ක්‍රියා කළ බව **නිකාය සංග්‍රහය** හා **සමන්තපාසාදිකාව** වැනි

ග්‍රන්ථයන්හි සඳහන් වේ.[7] ලක්දිව භික්ෂු පර්ෂදයේ වර්ධනයත් සමඟ දේශීය බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය ද සංවර්ධනය වෙමින් චිරස්ථායී බවට පත් විය.

ලංකාවේ බෞද්ධ අධ්‍යාපනය භික්ෂුව කේන්ද්‍ර කොට ගෙන පිරිවෙන් ආශ්‍රිත ව විකාසනය වූ අතර රජවරු මෙන් ම සාමාන්‍ය ජනයා ද භික්ෂූන් වහන්සේ වෙතින් අධ්‍යාපනය ලැබූහ. පුරාතනයේ භාවිත බෞද්ධ අධ්‍යාපන ක්‍රමවේදය පිළිබඳ විමසීමේ දී එය අනුක්‍රමයෙන් සංවර්ධනයට පත් වෙමින් කලක දී පැහැදිලි පාඨමාලා ක්‍රමයක් බවට පත් වූ බව දැකිය හැකි ය. ලාංකේය ඉතිහාසයේ ඒ ඒ යුගවලට අයත් ඓතිහාසික මෙන් ම සාහිත්‍ය මූලාශ්‍රය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී තත් යුගවල අධ්‍යාපන ක්‍රමවේදය විෂයෙහි වූ තොරතුරු රැසක් අනාවරණය වේ. මෙහි දී අප අවධානයට ලක් වන කෝට්ටේ යුගය පිළිබඳ සලකා බැලීමේ දී ද ඒ එසේමැයි. විශේෂයෙන් කෝට්ටේ යුගය නියෝජනය කරන සන්දේශ සාහිත්‍යයට අයත් ග්‍රන්ථ තත් අවධියේ පැවති බෞද්ධ අධ්‍යාපන ක්‍රමවේදය පිළිබඳ වැදගත් තතු රාශියක් හෙළි කරයි.

කෝට්ටේ යුගයේ රචනා වූ සන්දේශ කාව්‍ය අතරින් මුල් ම කෘතිය වන්නේ **පරෙවි සන්දේශයයි**. මෙහි කතුවරයා තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් බව පොදු පිළිගැනීමයි. තත් කෘතියට කතුවරයා දුන් නාමය වන්නේ "කලරැව් සඳෙස" යන්න වුවත් එහි එන "සැරද පරෙවිඳු සඳ" යන ඇමතුම නිසාත් පොතේ කිහිප පළක ම පරෙවි යන නාමයෙන් දූතයා හැඳින්වෙන නිසාත් පොදු ව්‍යවහාරයේ පවතින නිසාත් ඊට **පරෙවි සන්දේශය** යන නම යෙදිණි. 6 වන පැරකුම් රජුගේ දියණිය වූ චන්ද්‍රවතී කුමරියට සුදුසු සැමියෙකුත් අනතුරු ව රාජ්‍යභාරය ඉසිලීමට සුදුසු පුතෙකුත් උපුල්වන් දේවායාචනයකින් ලබා ගැනීම මේ කෘතිය ලියැවීමේ අරමුණයි. ක්‍රි. ව. 1430-1440 අතර කාලයේ මේ සන්දේශය ලියැවෙන්නට ඇතැයි පූජාවලිබණ්ඩාර සන්නස්ගල පෙන්වා දෙයි.[8] සන්දේශය යැවෙන්නේ ජයවර්ධනපුර කෝට්ටේ සිට දෙවිනුවර උපුල්වන් දේවාලය වෙතයි.

**පරෙවි සන්දේශයෙහි** පිරිවෙන් අධ්‍යාපනය පිළිබඳ සඳහන් වන්නේ නාම මාත්‍රික ව පමණි. එනම් පරාක්‍රමබාහු රජු පැපිලියානෙහි

තම මවු බිසෝ ස්වාමී සුනේත්‍රා දේවී නමින් පිරිවෙනක් කරවා භික්ෂූන්ට පූජා කළ බව සඳහන් වේ.[9]

අවසානයෙහි දැක්වෙන කර්තෘ සන්දර්ශිත පද්‍යයෙන් රහල් හිමියන්ගේ පාණ්ඩිත්‍යය පිළිබඳ කියැවෙන අතර, ඉන් බෞද්ධ අධ්‍යාපනය පිළිබඳ ගම්‍ය වේ.

**කඳ වුරු කුල උපන් රැඳි තොටගමු පියෙස**
**සෙද දත් සියල් කව් නළු මගද සකු බස**
**කඳ කුමරිඳු වර ලද පසළොස් වයස**
**වද හළ රහල් වැඩි තැන් කල රැවු සඳෙස** [10]

මෙහි "සියල් කව් හෙළු මගද සකු බස" යන්නෙන් සියලු කාව්‍ය උගත් බවත් හෙළු, මගද, සකු බස් දැන සිටි බවත් කියැවේ. එය එකල පැවති අධ්‍යයන ක්‍රමවේදයේ විෂය කොටස් පිළිබඳ වන ඉඟියකි.

දෙව්නුවර තිලක පිරිවෙන්පති ව වැඩ සිටි තෙරකෙනෙකුන් විසින් කරන ලද **කෝකිල සන්දේශය** ක්‍රි. ව. 1440-1446 අතර කාලයේ රචනා වී ඇත. යාපනය රාජ්‍යය සපුමල් කුමරුට ස්ථිර කර දෙන ලෙස දෙව්නුවර උපුල්වන් දෙවියන් යැදූ බව ඔහුට දන්වනු සඳහා **කොවුල් සන්දේශය** කර තිබේ. මේ කෘතියට කතුවරයා දුන් නාමය වන්නේ පරපුටු සඳෙස යන්නයි.

**කෝකිල සන්දේශයෙහි** ද පිරිවෙන් අධ්‍යාපනය පිළිබඳ දැක්වෙන තොරතුරු ඉතා අල්ප ය. මෙහි රහල් හිමියන් ත්‍රිපිටක වාගීශ්වර වූ විජයබා පරිවේණාධිපති ලෙස වර්ණිත ය.[11]

මෙහි ද කර්තෘ සන්දර්ශිත පද්‍යයෙහි ඉරුගල්කුලතිලක පිරිවෙන්පති හිමියන් පිළිබඳ කියැවේ.

**උස දෙව්නුවර දිසි ඉරුගල්කුලට කිරුල්**
**යස සිරි වඩන නිසි ගිරිවැසි තෙරිඳු එමල්**
**තොස යුතු තිලක පිරුවන්හිමි පවර නිමල්**
**රස කර පැවසු පරපුටු සඳෙස රුත් ළකල්**[12]

මෙසේ දැක්වෙන පරිවේණාධිපති හිමිවරුන් හා පිරිවෙන් පිළිබඳ එන සඳහන හැර අධ්‍යාපන ක්‍රමවේදය විෂයෙහි වැඩි තොරතුරක් මෙහි ද නොදැක්වේ.

කෝට්ටේ අවධියෙහි ලියැවුණු තුන්වන සන්දේශය ලෙස සැලකෙන **සැළලිහිණිය** ක්‍රි. ව. 1450 දී පමණ තොටගමුවේ රාහුල හිමියන් විසින් රචනා කරන ලද්දකි. පරාක්‍රමබාහු රජුගේ දියණිය වූ උලකුඩය දේවියට පුතෙකු ලබා දෙන මෙන් ඉල්ලා කැලණියේ විභීෂණ දෙවියන් වෙත මේ සන්දේශය යැවේ.

**සැළලිහිණි සන්දේශයෙහි** ද පිරිවෙන් පිළිබඳ සඳහන් වන්නේ නාම මාත්‍රික ව පමණි. ඒ ද කර්තෘ සන්දර්ශිත පද්‍යයෙහි පමණ ය.

**කඳවුරු කුළ මැඳුරු මිණි පහනෙ'ව් සුසැදි**
**නැණගුරු සබස සමය ද දැනුමෙන් වොරැඳි**
**රජගුරු විජයබා පිරුවන් හිමි පැහැදි**
**මෙ මියුරු පදැ'ති සැළලිහිණිය අස්න යෙදී**[13]

ක්‍රි. ව. 1457-1465 අතර කාලයක ලියැවුණු බව පිළිගැනෙන **ගිරා සන්දේශයෙහි** කතුවරයා කවුරුන් ද යන්න පැහැදිලි නැත. මෙය ජයවර්ධනපුර මහා විහාරයක විසූ හිමිනමක විසින් ලියන ලදැයි යන්න පොදු පිළිගැනීමයි. සිරි පැරකුම්බා රජුත් ලක් සසුනත් ආරක්ෂා කර දෙන මෙන් විජයබා පිරිවෙන්පති රහල් හිමියන් ලවා නාථ දෙවියන් අයැදීම පිණිස මේ සන්දේශය ලියා තිබේ.

**ගිරා සන්දේශයෙහි** අස්න පිළිගන්වන තෙරුන්වහන්සේ වර්ණනා කරන අවස්ථාව එකල පැවති අධ්‍යාපන ක්‍රමවේදයේ එක්තරා විෂය ක්ෂේත්‍රයක් හෙළි කරන්නකි.

**තෙවළා වදනිසුරු විජයබ තෙරිඳු හට**
**නොවළා ගොසින් මෙ හසුන් සැළ කරව සිට**[14]

ත්‍රිපිටක වාගීශ්වර විජයබාහු තෙරිඳුන්හට හසුන සැළ කරන්නට යැයි පවසමින් මෙහි දී උන්වහන්සේ වර්ණනා කරන අතර ඉන් හෙළි වන්නේ උන්වහන්සේගේ උගත් බවයි. එකල

ත්‍රිපිටකය උගැන්ම පැවති අතර එහි නිපුණ වූවන්ට උපාධි නාම පවා පිරිනමා ඇති බව මෙයින් පැහැදිලි වේ.

තත් යුගයේ පැවති පිරිවෙන් අධ්‍යාපනය පිළිබඳ තොරතුරු රාශියක් **ගිරා සන්දේශයේ** ඇතුළත් විජයබා පිරිවෙන් වර්ණනාවෙන් හෙළි වේ. එක් පසෙකින් මේ වර්ණනයෙන් පිරිවෙනෙහි විෂය නිර්දේශය ද විස්තර වේ.

**මනරම් වෙහෙර තුළ තැන තැන සැපැමිණය**
**සිතියම් බණ වසුන් විදහා අපමණය**
**සිතසොම් නසින් සිහි කර කර බුදු ගුණය**
**අබිදම් පෙළ අරුත් විමසන සඟ ගණය**[15]

අභිධර්ම පාලිය එකල මෙහි ඉගැන්වූ බව මින් හෙළි වේ. "සිතියම් බණ වසුන් " නම් බණ පොත් වසා බඳින වස්ත්‍රයි. ඒ වස්ත්‍ර සිතියම් කර ඇත. වසුන් යන්න එන්නේ පාළි, සංස්කෘත භාෂාවල වස්ත්‍රවාචී වසන යන්නෙන් බව සුචරිත ගම්ලත් සිය ගිරා සඳෙස හා විනිස කෘතියෙහි පෙන්වා දෙයි. වසුන් යන්නෙන් පුස්කොළ පොත් වසන ලී වැස්ම වන කම්බ ද ගත හැකියි. වැස්ම යන අරුත්හි ද පෙළ, සකු බස්වල වසන යන්න පෙනේ.[6] මෙහි අවසාන පද්‍ය පාඨය විමසන කල්හි අභිධර්ම පාලිය එකල පිරිවෙන්හි විෂය නිර්දේශයට ඇතුළත් ව තිබූ බව පැහැදිලි වේ.

**උතුරු ගුණෙන් සැපැමිණ පිළිවෙත් මඟය**
**පතුරු වමින් සත වෙත මෙත් මහ ගඟය**
**අතුරු දහන් කෙරෙමින් සිවු අව මඟය**
**සුතුරු දහම් පවසන සමහර සඟය**[17]

සමහර සංඝයා සුතුරු දහම් කියවන බව පැවසීමෙන් එකල සූත්‍ර ධර්මය ද ඉගැන්වූ බව පැහැදිලි වේ. දික්, මැදුම්, සංයුත්, අංගුත්තර, කුදුගත් යන සඟි පසින් යුක්ත සූත්‍ර පිටකය මෙහි දී සූත්‍ර ධර්ම ලෙස හැඳින්වූ බව පෙනේ.

**සමහර සුපිළිපන් සඟ ගණ මන මෙනය**
**පුවතර අරුත් ටීකා ගෙන වෙන වෙනය**

පැනසර ඇදුරු උවදෙස් බස් දැන ගෙනය
නොමහැර ගැඹුරු තැන් විමසති විනය නය[18]

"සමහර සංඝ සමූහයා කැමති පරිද්දෙන් වෙන වෙන ප්‍රසිද්ධ අටුවා ටීකා ගෙන ප්‍රඥාසාර වූ ආචාර්ය උපදෙස් බස් දැනගෙන විනය ක්‍රමයේ ගැඹුරු තැන් අත් නොහැර ම විමසති" යන්න මෙහි අර්ථයයි. විනය පිටකය මෙකල ඉගැන්වූ බව මින් හෙළි වේ. ඒ සඳහා අටුවා ග්‍රන්ථ ද පාදක කොට ගෙන ඇත.

ගැඹුරු නොයෙක තැන් පිළිවිස සිත් ලෙසින
වෙහෙර පසෙක ඉඳ සොඳ පොත්පත් රැගෙන
නො හැර සලකමින් සන් සඳ'රුත් යෙදෙන
හෙරණ රැසෙක වියරණ වනපොත් කරන[19]

සාමණේර හිමිවරුන් සඳහා වියරණය වනපොත් කරවූ බවට එන මෙම සඳහන එකල පිරිවෙන්හි ව්‍යාකරණය ඉගැන්වූ බවට ලැබෙන මනා සාධකයක් ද වෙයි. සන් හෙවත් සංඥා සහ සඳ හෙවත් සන්ධි මේ ඉගැන්වීම්වලට ඇතුළත් වූ වියරණ ප්‍රභේද විය.

තියුණු නැණින් කෙරෙමින් සැක නිවාරණ
පමුණු වමින් එකිනෙක සමය කාරණ
දැමුණු සිතින් ඉඳ කර වෙහෙර පූරණ
බමුණු රැසෙක් වෙද'රුත් කෙරෙති දාරණ[20]

මෙය තත් යුගයේ අධ්‍යාපන ක්‍රමවේදය පිළිබඳ කියැවෙන සුවිශේෂ කාව්‍යයකි. මෙම පිරිවෙනෙහි සිට වේදයන්හි අරුත් ධාරණය කරනුයේ බමුණු සමූහයක් වීම විශේෂත්වයකි. මෙහි පැවසෙනුයේ ඍග්, යජුර්, සාම, අථර්වන් යන වේද පිළිබඳවයි. මෙහි ධාරණ කිරීම ලෙස දැක්වෙන්නේ පාඩම් කිරීම බව සුචරිත ගම්ලත් පෙන්වා දෙයි.[21] මෙයින් හෙළි වන ප්‍රධාන ම කාරණය වන්නේ තත් අවධියේ පිරිවෙන්හි ඉන්දීය වේද සාහිත්‍ය කෘති ද ඉගැන්වූ බවයි.

සබා තුරු ලෙසින් බෙල්ලන් ගෙන නො මද
තබා පෙළින් පෙළ ඇදැ නිල් පලග මැද
හබා සෙද තැනින් තැන ගහ ගණන් බැඳ
පබා කර සිදත් සමහරු ගණිති ඉඳ[22]

"ඇතැම්හු හිඳ ගෙන තාරකා මෙන් කාන්ති සහිත වූ බොහෝ කවඩි ගෙන නිල් පුවරු මැද පෙළින් පෙළ තබා අදිමින් වහා බෙදමින් තන්හි තන්හි ග්‍රහ සංඛ්‍යාවන් බඳිමින් සූර්ය සිද්ධාන්තය ගනිත්." මෙය ද පිරිවෙන්වල ඉගැන්වූ අප්‍රකට විෂය ප්‍රභේද පිළිබඳ පැවසෙන අවස්ථාවකි. මෙහි දී නක්ෂත්‍ර විද්‍යාව උගන්නා අනුපිළිවෙළ පවා දක්වා තිබේ. පෞලිශ, රෝමක, වාශිෂ්ඨ, සෞර, පෛතාමහ යනුවෙන් ජ්‍යොතිශ්ශාස්ත්‍රයෙහි ප්‍රධාන සිද්ධාන්ත 5ක් වන බවත් පබාකර සිදත් යනු මේ සිව්වැන්න බවත් විචාරකයෝ පෙන්වා දෙති.[23] සූර්ය යන්නෙන් සෞර් යයි තද්ධිත පදයක් සෑදේ. ප්‍රභාකර යනු ද සූර්යයාට නමි. සෞර සිද්ධාන්තය යනු සූර්යයා විසින් යම නම් අසුරයෙකුට කියන ලද්දක් ලෙස සම්පාදිත ජ්‍යොතිර් ග්‍රන්ථයයි.[24]

**මුනිවිරු දෙසු සදහම් මෙන් ඇම දවස**
**උවදුරු දුරැ'ර රකිනු ව සත් වග වෙසෙස**
**පෙරැ'දුරු ඉසිවරන් පැවසූ නොයෙක ලෙස**
**වෙදවරු වෙද සතර පිරුවති එහි සතොස**[25]

"එහි වෙදවරු, සැම දවස උවදුරු දුරු කර සත්ත්ව වර්ගයා විශේෂයෙන් රකිනු පිණිස බුදුහු දෙසූ සද්ධර්මය මෙන් පෙර ආචාර්ය ඍෂිවරුන් නොයෙක් ලෙස පැවසූ වෛද්‍ය ශාස්ත්‍රය සන්තෝෂයෙන් පාඩම් කෙරෙති." මෙහි පැවසෙන වෙදවරු යන්න ගිහි ශිෂ්‍යයන් ද පැවිදි ශිෂ්‍යයන් ද යන්න පැහැදිලි නැත. කෙසේ වුවත් වෛද්‍ය ශාස්ත්‍රය ද පිරිවෙන් අධ්‍යාපනය ඔස්සේ මෙකල ප්‍රධාන විෂයයක් ලෙස ඉගැන්වූ බව මින් පැහැදිලි වේ.

**මනහර පොත් රැගෙන පරසිඳු පෙර පටන**
**එහි පද'රුත් කියන ලෙස නො හැර දැන ගෙන**
**සුර ගුරු'වත් උතුරු දෙම්හ යි වන පොතින**
**සමහරු'රුත් සතර පිරුවති නොයෙක තැන**[26]

"සමහරු පෙර පටන් ප්‍රසිද්ධ වූ මනහර පොත් ඇර ගෙන එහි පදාර්ථ කියන ආකාරය සපුරා ම දැනගෙන සුරගුරු ආවත් කට පාඩමින් උත්තර දෙම්හයි නොයෙක තැන අර්ථ ශාස්ත්‍රය පාඩම් කරත්." මෙහි පද අරුත් ලෙස දැක්වෙන්නේ පදවල අර්ථ යන්නයි. අරුත් සතර යන්නෙන් අර්ථ ශාස්ත්‍රය ගැනේ. අර්ථ යනු ලෞකික

ජීවිතයට ප්‍රයෝජනවත් දෑ ය. එය ඉගැන්වෙන්නේ අර්ථ ශාස්ත්‍රයේ ය. දැනට ප්‍රකට අර්ථ ශාස්ත්‍ර ග්‍රන්ථය නම් චාණක්‍ය නමැත්තාගේ කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රයයි. එයින් මේ පිරිවෙනෙහි ඉගැන්වූ අර්ථ ශාස්ත්‍රය යනු කුමක්ද යන්න පැහැදිලි නැත. එහෙත් භාරතීය වේද ග්‍රන්ථ ද මෙහි ඉගැන්වූ බව සඳහන් වීම නිසා මෙයින් පැවසෙන්නේ කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍ර ග්‍රන්ථය යැයි සිතිය හැකි ය. මෙය ගිහි ශිෂ්‍යයන් විෂයෙහි උගන්වන්නට ඇතැයි සිතිය හැකි ය.

**සිරිමත් සොඳුරු එ වෙහෙර තැන තැන ලකුළු**
**ඉඳ සිත් ලෙසට පෙර කිවියර සිරි රැකුළු**
**දැන ගත් සඳද ලකර වියරණ වියත් මුළු**
**පවසත් සකු මගද එළු දෙමළ කව් නළු**[27]

"පුරාණ කවිවරයන්ගේ ආකාරය (ප්‍රකාශ) කළා වූ ඡන්දස්, අලංකාර, වියරණ දැන ගත් වියත් සමූහයා සිරිමත් වූ සුන්දර වූ ඒ විහාරය අලංකෘත කළා වූ තන්හි තන්හි සිත් පරිදි හිඳ සංස්කෘත, පාළි, සිංහල, දෙමළ කාව්‍ය නාටක පවසත්."

සඳ යනු ඡන්දස් ශාස්ත්‍රය හෙවත් වෘත්ත ලක්ෂණ උගන්වන ශාස්ත්‍රයයි. ලකර යනු අලංකාර ශාස්ත්‍රය නැතහොත් නිදොස් රසවත් කාව්‍ය රචනය උගන්වන ශාස්ත්‍රයයි. කාව්‍ය නාටක ද මේ පිරිවෙනෙහි ඉගැන්වූ බව සඳහන් වීම තත් යුගයේ අධ්‍යාපන ක්‍රමවේදය පිළිබඳ වටිනා තොරතුරකි.

මේ හැරුණු කොට විජයබා පිරිවෙන්පති සිරි රහල් හිමි පිළිබඳ ව සඳහන් වේ.[28] උන්වහන්සේ උතුරුමුළ මහ තෙරිඳුගේ මුනුබුරු ලෙස දක්වා ඇත. උතුරුමුළ යනු පුරාණ සංඝායතනයක නමකි. ආයතන, ගණ, මූළ යනුවෙන් හැඳින්වුණු එබඳු සඟ පරපුරු අටක් පෙර කල්හි පැවතිණි. තව ද, අසදෘශ ප්‍රඥා පාටව ප්‍රශස්තතර ත්‍රිපිටක වාගීශ්වර ශ්‍රී සංඝබෝධි විජයබා ස්ථවිරෝත්තමයාගේ මෙද එක් වර්ණ භාෂණයෙක. එ ද තා කර්ණ භූෂණය කර.[29]

ත්‍රිපිටක වාගීශ්වර යන්නෙන් ත්‍රිපිටක වචනයෙහි අධිපති නැතහොත් සූත්‍ර, විනය, අභිධර්ම යන පිටක තුනෙහි විශේෂඥ යන්න කියැවේ. මෙහි දැක්වෙන ශ්‍රී සංඝබෝධි විජයබාහු යනු තොටගමු

විහාරයේ නමයි. එමෙන් ම උන්වහන්සේ ව්‍යාකරණ ශාස්ත්‍රය ද දැන සිටි බව "නොහැර සිත සෙ දැනගෙන අට වියරණය"[30] යන්නෙන් කියැවේ. මෙහි අට වියරණය යනු ඉන්ද්‍ර, චන්ද්‍ර, කාශකෘත්ස්න, අපිශල, ශාකටායන, පාණිනී, අමර, ජෛනේන්ද්‍ර යන ඇදුරන්ගේ අට වැදෑරුම් වියරණ ක්‍රමයි. රහල් හිමියන් මේ ශාස්ත්‍ර දැන සිටි බව කීමෙන් ප්‍රත්‍යක්ෂ වන්නේ තත් යුගයේ මේ සිද්ධාන්ත ඉගැන්වූ බවයි.

"සේ පිරි යත් මහ කව් දැන ගෙන යෙහෙන"[31] යන්නෙන් උන්වහන්සේ මහාකාව්‍යයන් යෙහෙන් දැන ගෙන සිටි බව කියැවේ. එමෙන් ම ඡන්දෝලංකාර ශාස්ත්‍රය උන්වහන්සේ අතැඹුලක් සේ දත් වග 240 වන කවියේ ප්‍රකාශිතයි.

**තිවට කසුබු ඉසි සුරගුරු මෙන් සුබද**
**ලොවට කලණ ඒ යති සඳුගේ නොමද**
**සුමට වදන් දුළ විසිතුරු මහ මුහුද**
**දස'ට පොරණ රළ පතරින් පිරි නිබඳ**[32]

රාහුල හිමියන්ගේ යහපත් වචන ලොවට සුබවාදී වූ ආකාරයත් ඒවා දස අට පුරාණයන්හි එන කථාවලින් පිරී පැවති ආකාරයත් මින් සූචිත ය. දස අට පොරණ කථා යනු බ්‍රහ්ම, පද්ම, විෂ්ණු, ශිව, භගවත්, නාරද, මාර්කණ්ඩේය, අග්නි, භවිෂ්‍යත්, බ්‍රාහ්මවෛවර්ත, ලිංග, වරාහ, ස්කන්ද, වාමන, කූර්ම, මත්ස්‍ය, ගරුඬ, බ්‍රහ්මාණ්ඩ යන පුරාණ නමින් හැඳින්වෙන ග්‍රන්ථයි. බ්‍රහ්ම, විෂ්ණු ආදීන් පිළිබඳ අද්භූත කතා මේවායෙහි ඇතුළත් ය. එකල අධ්‍යාපන ක්‍රමවේදය තුළ මෙන් ම භික්ෂූන් අතර ද මේ ග්‍රන්ථ පරිහරණය වන්නට ඇත.

රාහුල හිමියන් දස අට විද්‍යා ද දැන සිටි බව කියැවේ.[33] එනම් ශික්ෂා, කල්ප, ව්‍යාකරණ, නිරුක්ති, ඡන්දශ්ශාස්ත්‍ර, ජ්‍යොතිශ්ශාස්ත්‍ර යන වේදාංග හයත් ඍග්, යජුර්, සාම, අථර්වන් යන වේද සතරත් මීමංසා, න්‍යාය, ධර්ම ශාස්ත්‍ර, පුරාණ, ආයුර්වේද, ධනුර්වේද, ගාන්ධර්ව, අර්ථ ශාස්ත්‍ර යන අංගයනුත් ය. මේ සෑම විෂය ක්ෂේත්‍රයක් පිළිබඳ ව ම එකල උගත් භික්ෂූන් දැන සිටි වග නොරහසකි.

**ගිරා සන්දේශයට** පිළිතුරු කවක් ලෙස ලියැවී ඇති, **හංස සන්දේශය** ක්‍රි. ව. 1457-1465 අතර කාලයට අයත් ලෙස සැලකේ.

මෙහි කතුවරයා සඳහන් ව නැත. රතන සූත්‍රය ලක්ෂ වාරයක් සජ්ඣායනා කොට දෙවියන්ට පින් දී සතුටු කරවා සතුරු වියවුල් දුරු කර පැරකුම් රජුට ආසිරි සලස්වන සේ නියෝග කරන ලෙස වනරතන මාහිමියන්ගෙන් කරන ඉල්ලීමකි එහි ඇත්තේ. **හංස සන්දේශයෙහි** කැරගල පද්මාවතී පිරිවෙන් වර්ණනාවෙහි පිරිවෙන් අධ්‍යාපනය පිළිබඳ පැහැදිලි විස්තරයක් එයි.

**සරණ වැඳ ගුරුන් කියවා දිනෙන් දින**
**පරණ අලුත් පොත් පෙරළා පනින් පන**
**දරණ කරන ලෙස ඉඳගෙන වෙනින් වෙන**
**හෙරණ සික කියති හෙරණෝ තැනින් තැන**[34]

මින් පැවසෙන්නේ සාමණේර භික්ෂු අධ්‍යාපනය පිළිබඳවයි. හෙරණ සික යනු අනුරාධපුර යුගයේ ලියැවුණු සාමණේර හිමිවරුන්ගේ ශික්ෂා පද ඇතුළත් අදට ද විද්‍යමාන වටිනා ග්‍රන්ථයකි.

**මෙන් සක කිරඹ පිරිසිදු කර සිල් ගුණය**
**ඉන් සැක නොවී කරණුව සසර තරණය**
**නන් සික පද නිබඳ රකිනා ලෙස පණය**
**මුන් සික සික වළඳ විමසන සඟ ගණය**[35]

මෙහි මූල සික්ඛා සහ සික්ඛා පද වලඤ්ජනය යන පොත් උගත් බව සඳහන් වේ. මෙම පොත් උපසම්පදා භික්ෂූන් විෂයෙහි වූ ශික්ෂා පද සඳහන් වන ග්‍රන්ථයි. ඒ ඒ භික්ෂූන් උදෙසා වෙන් කරන ලද විෂයය කොටස් සහ නියමිත ග්‍රන්ථ සහිත අධ්‍යාපන ක්‍රමවේදයක් පැවති බව මෙයින් පැහැදිලි වේ.

මේ කාරණාකාරණ විමසා බැලීමේ දී තත් යුගය වන විට බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය නිරවුල් විෂය නිර්දේශයක් ඔස්සේ ගිහි පැවිදි දෙපිරිසට ම දැනුම බෙදා දෙන සංවිධානාත්මක අධ්‍යාපන පටිපාටියක් ලෙස සකස් ව පැවති බව පැහැදිලි වේ.

## ආන්තික සටහන්

1. පඤ්ඤාලෝක හිමි, මීගොඩ, ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය. (කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, ප්‍ර. මු. 2002) 02 පිට.
2. එහි ම, 14 පිටුව.
3. එහි ම, 13 පිටුව.
4. එහි ම, 105 පිටුව.
5. එහි ම, 106 පිටුව.
6. එහි ම, 106 පිටුව.
7. සන්නස්ගල, පුඤ්චිබණ්ඩාර සිංහල සාහිත්‍ය වංශය, (කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, ප්‍ර. මු. 1961)
8. පරෙවි සන්දේශය. (සංස්.) ඒ. ඒ. අභයසිංහ, (කඩවත: අභය මුද්‍රණ ශිල්පියෝ, ප්‍ර. මු. 1997) 49 කවිය.
9. එහි ම, 198 පිටුව.
10. කෝකිල සන්දේශය. (සංස්.) එම්. එච්. එෆ්. ජයසූරිය, 82 කවිය.
11. එහි ම, 292 කවිය.
12. සැළලිහිණි සන්දේශය. (සංස්.) මදුරසිංහ ගුණතිලක, (කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, ප්‍ර. මු. 1995) 105 පිටුව.
13. ගිරා සඳෙස හා විනිස. (සංස්.) සුචරිත ගම්ලත්, (කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, ප්‍ර. මු. 1988) 70 පිටුව.
14. එහි ම, 156 පිටුව.
15. එහි ම, 157 පිටුව.
16. එහි ම, 157 පිටුව.
17. එහි ම, 157 පිටුව.
18. එහි ම, 158 පිටුව.
19. එහි ම, 158 පිටුව.
20. එහි ම, 158 පිටුව.
21. එහි ම, 158 පිටුව.
22. එහි ම, 159 පිටුව.
23. එහි ම, 159 පිටුව.
24. එහි ම, 159 පිටුව.
25. එහි ම, 160 පිටුව.
26. එහි ම, 160 පිටුව.
27. එහි ම, 232 කවිය.
28. එහි ම, 164 පිටුව.
29. එහි ම, 237 කවිය.
30. එහි ම, 239 කවිය.
31. එහි ම, 169 පිටුව.
32. එහි ම, 170 පිටුව.

33. හංස සන්දේශය. (සංස්.) කේ. ඩී. පී. වික්‍රමසිංහ, (කොළඹ: සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, ප්‍ර. මු. 1995) 173 කවිය.
34. එහි ම, 174 කවිය.

## මූලාශ්‍රය නාමාවලිය

**කෝකිල සන්දේශය.** (සංස්.) එම්. එච්. එෆ්. ජයසූරිය.
**ගිරා සඳෙස හා විනිස.** (සංස්.) සුචරිත ගම්ලත්, (කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, ප්‍ර. මු. 1988).
නිට්ස්, එම් වින්ටර්, **ඉන්දීය සාහිත්‍ය ඉතිහාසය.** (කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, ප්‍ර. මු. 1967).
පඤ්ඤාලෝක හිමි, මීගොඩ, **ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය.** (කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, ප්‍ර. මු. 2002).
**පරෙවි සන්දේශය.** (සංස්.) ඒ. ඒ. අභයසිංහ, (කඩවත: අභය මුද්‍රණ ශිල්පියෝ, ප්‍ර. මු. 1997).
සන්නස්ගල, පුඤ්චිබණ්ඩාර. **සිංහල සාහිත්‍ය වංශය**, (කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, ප්‍ර. මු. 1961).
**සැළලිහිණි සන්දේශය.** (සංස්.) මදුරසිංහ ගුණතිලක, (කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, ප්‍ර. මු. 1995).
**හංස සන්දේශය.** (සංස්.) කේ. ඩී. පී. වික්‍රමසිංහ, (කොළඹ: සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, ප්‍ර. මු. 1995).